


EDITED BY ASOKA SILVA

# වේග පන්දුවේ අමතක නොවන දක්ෂයා

## දුලිප් ලියනගේ

ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කල මද වේග පන්දු යවන්නෙකු වන දුලිප් ලියනගේ කළුතර විද්‍යාලයෙන් පාසැල් ක්‍රිකට් පිටියට අවතීර්ණ වූ අතර 1991 වසරේ සිට දශක එක හමාරක කාලයක් කෝල්ට්ස් සහ බී.ආර්.සී. කණ්ඩායම් වෙනුවෙන් පලමු පෙල තරග ක්‍රීඩා කළේය.

1992 1993 ඔස්ට්‍රේලියා පිලේ ශ්‍රී ලංකා සංචාරය තුල ආර්. ප්‍රේමදාස පිටියේ පැවති තරගයේදී ඔහු ටෙස්ට් වරම් දිනා ගත්තේය. එම තරගයේ ඔහු ක්‍රියාත්මක කළ පලමු පන්දු වාරයේ තුන්වන පන්දුවෙන්ම ඔහු කඩුළු අතරට පැමිණෙන්නේ ටොම් මූඩි දවා ගනිමිනි.

ඉහත සදහන් තරගයේදී ටෙස්ට් වරම් දිනා ගත් අනෙක් සුවිශේෂී ක්‍රීඩකයා වන්නේ මුත්තයියා මුරලිදරන් ය.

මීලගට ඔහු සහභාගි වන තරග දෙක වන්නේ ඔස්ට්‍රේලියාව සමග පැවති තෙවන ටෙස්ට් තරගය සහ නවසීලන්ත පිල සමග පැවති පලමු ටෙස්ට් තරගයයි. එම තරග දෙකේදීම ඔහු ඉනිමක කඩුලු හතර බැගින් ලබා ගන්නවා. මෙම තරග දෙකම මොරටුව ක්‍රීඩාංගණයේ පැවති නිසා එම ක්‍රීඩාංගණය ඔහුට වාසනාවන්ත ක්‍රීඩාංගණය ක් ලෙස සැලකීමට පුළුවන්.

ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය සමග පැ වති තරගාවලි දෙක ඔහු හමාර කරන්නේ තරග හතරකදී කඩුලු පහළොවක් දවා ගනිමින්. තම ක්‍රීඩා දිවිය ආරම්භයේදී පෙන්නුම් කල සාර්ථකත්වය දිගටම පවත්වා ගැනීමට ඔහු අසමත් වන්නේ ආබාධ වලට ගොදුරු වීම නිසයි. 1993 සහ 1994 යන වසර දෙක තුල ඔහුට ක්‍රීඩා කරන්නට ලැබෙන්නේ ටෙස්ට් තරග හතරක් පමණයි.

1997 වසරේදී ඔහු නැවතත් එක්දින සංචිතයට ඇතුලත් වෙනවා. සංචිතයට ඇතුලත් වුවත්,

1. ඔහු සහභාගී වූ බොහෝ සංචාර ආසියාතික කලාපයේ පැවැත්වීම.

2. ආසියානු තණතිලි වල තරග පැවැත්වෙන විට වේග පන්දු යවන්නන් දෙදෙනෙකුට වඩා කණ්ඩායමට ඇතුලත් නොවීම.

3. එම කාලය වන විට වාස් සහ සජීව ද සිල්වා එක්දින කණ්ඩායමේ නිත්‍ය ආරම්භක පන්දු යවන්නන් ලෙස කටයුතු කිරීම වැනි කරුණු නිසා දුලිප්ට තරග අවස්ථාවක් ලැබීම බොහෝ විට සිදු වූවේ ක්‍රීඩකයෙකු ආබාධයකට ලක් වූ විට හෝ විවේක ගැන්වූ විටයි.



1997 වසරේ පැවති ශ්‍රී ලංකා පිලේ කොදෙව් සංචාරය තුල ශ්‍රී ලංකා පිලට හිමි වූවේ එක් එක්දින තරගයක් පමණයි. තරගය ශ්‍රී ලංකා කණ්ඩායම පරාජය වුවත් ලියනගේ සහ කුමාර් ධර්මසේන අටවන කඩුල්ල සදහා ලකුණු අනූ එකක සම්බන්ධයක් ගොඩ නැගුවහ. එය ශ්‍රී ලංකා වාර්තාවකි.

1997 පකිස්ථාන නිදහස් සැමරුම් කුසලානයට පසු ආබාධයකට ලක්වීම නිසා ඔහුට නැවතත් කණ්ඩායමෙන් ඉවත් වන්නට සිදුවිය. පලමු පෙළ තරගාවලිය තුල දැක්වූ දස්කම් නිසා 2001 වසරේදී ඔහු නැවත කණ්ඩායමට ඇතුලත් වුවත් ඔහුට ක්‍රීඩා කිරීමට ලැබෙන්නේ එක් එක්දින තරගයක් සහ එක් ටෙස්ට් තරගයක් පමණයි.

ඔහු අවසන් වරට ශ්‍රී ලංකා පිල නියෝජනය කලේ 2003 වසරේ හොංකොං සය සාමාජික තරගාවලිය තුලයි. ඔස්ට්‍රේලියාවේ ලීග් තරග ක්‍රීඩා කර ඇති දුලිප් එහි පුහුණුකරුවෙකු ලෙසද කටයුතු කරයි.

නිරහංකාර ගති පැවතුම් ඇති මේ අමතක නොවන ක්‍රීඩකයාට සන්නසේ සුබපැතුම්



**රුවන්ත ගුණරත්න**




**අන්දරේ රජ කුමරියට උපහාස කවියක් ලිව්වා. ඇය රජතුමාට පැමිණිලි කළා ම අන්දරේ ඒ වෙනුවට වෙන කවියක් කියලා ඔළුව බේරගත්තා.**

**දවසක් "අන්දරේගේ බිරින්දෑ බලන්නට ආසයි. එක්ක වරෙන්" කියලා රජ බිසව කිව්වා.**

ඒ වෙලාවේ අන්දරේ බිසවුන් වහන්සේට කිව්වෙ බිරින්දෑ බිහිරි නිසා ඇයට හයියෙන් කථා කළ යුතු බවයි.

ගෙදර ගිහින් බිරින්දෑට කිව්වා "බිසවගේ කන ඇහෙන්නෙ නෑ. උඹ පුළුවන් තරම් හයියෙන් කථා කරපං" කියලා.

අන්තිමට රජතුමාට වගේ ම රාජ සභාවට රැස්ව සිටි සෙසු පිරිසටත් හොඳට ම හිනා වෙන්න පුළුවන් වුණා.

ඊට පස්සෙ මොකද වුණේ?

රජ බිසව බෙහෙවින් ලස්සනයි. ඇගේ සිරුරේ අපූරු හැඩතල පිහිටලා තියෙනවා. ඈ ඇවිදිනවා බලන් ඉන්න එකත් ඇසට බෙහෙවින් ප්‍රිය යි. අන්දරේ රජ බිසව ගැන වහ වැටුණා. තමන්ගේ තරම අමතක වෙලා විතරක් නෙවෙයි, අවදානමත් කල්පනාවට ආවේ නෑ.

මේ යෝදයා රජ බිසව තමන්ගේ වසඟයට ගන්නට වලි කනවා.

බිසවට දැනුණා. මේ කොහෙද යන නාටිෙ ටක් නිසා තමනුත් රාජ උදහසට ලක්වන්නට ඉඩ තිබෙන බව ඇයට තේරුණා. රජතුමා කෝප ගන්නේ නැති විදියට යාන්තමින් සිද්ධිය රජතුමාට කියන විදියක් කල්පනා කළා.

පාන්දර යාමේ බිසවුන් වහන්සේ එක්ක ව්‍යායාම කළාට පස්සේ රජතුමාට උණුසුම් පානයක් බොන්නට දීලා එයාගේ ගත සිත ප්‍රබෝධමත් වෙලා ඉන්න වෙලාව තමයි බිසව මේ අලකලංචිය රජතුමාගේ කනේ තියන්න තෝරා ගත්තේ.

රජතුමාට කේන්ති ගියේ නෑ. සිත බොහොම සන්සුන් අවස්ථාවක් නේ. සිතිවිලි පහළ වෙන්න කියාපු වෙලාව නෙ. මදහස පෑවා විනා කිසිවක් කීවේ නෑ.

දහවල් කාලයේ දී රජතුමාට අන්දරේ මුණ ගැසුණා. රජතුමා ඔහුට නියෝගයක් කළා.

"වැව්, පොකුණු, දිය අගල්, ගංගාවලින් වගේ ම පින්තාලි කිහිපයකිනුත් වතුර අරන් වරෙන්."

අන්දරේ මුලින් ම ගියේ කුඹලා මුණ ගැහෙන්න.

"දිවුල් ගෙඩි තරමේ කල හැට හැත්තෑවක් ඕන. රජතුමාගේ අණ." අන්දරේ දුන්නා ලණුවක්.

ඊළඟට ගියා වඩු අප්පුගෙ ගෙදර.
"අඩිය පැතලි හතරැස් තට්ටු දෙකක් එක්ක කදක් හදාපන්. වහාම. රජතුමාටයි ඕන කරලා තියෙන්නේ."

මේ විදියට ම පුංචි දරණුත් හදවා ගත්තා. හැන්දෑ යාමේ දිය තිබෙන තැන් සොයා ගියා.

ඊළඟ දවසේ උදේ අන්දරේ කදත් බැඳගෙන රජවාසලට ගියා. පුංචි පුංචි කලගෙඩි හැට හැත්තෑවක්.

"පස්වාන් දහසකට බුදුවන්න රජතුමනි. මේ ඉසව්වේ තිබෙන වැව්, පොකුණු, ඇල, දොළ, ගංගා, ළිං හැම එකකින් ම දිය ගෙනාවා."

රජතුමා කලයක් පෙන්නුවා. "මේ කලේ තියෙන්නේ මොන වතුර ද?"

"ඒ අහවල් වැවේ දිය රජතුමනි."
"උගුරක් දෙකක් බීපිය."
අන්දරේ බිව්වා.

"එතකොට මේ කලේ තියෙන්නේ මොන වතුර ද?"

"අහවලාගේ ළිඳේ වතුර."

"ඒකෙනුත් උගුරක් දෙකක් බීපිය."

අන්දරේට මේ විදියට හැම කලේකින් ම වතුර බොන්න සිද්ධ වුණා. ඊට පස්සේ මඟුල් පොකුණෙන් වතුර කලයකුත් ගෙන් වාගෙන ඒකෙනුත් බොන්න දුන්නා.

"උඹ වැව්වල, පොකුණුවල, ළිං වල, ඇල, දොළ ගංගාවල වතුර බිව්වා නෙ. මඟුල් පොකුණෙනුත් වතුර බිව්වා නෙ. දැන් මට සහසුද්දෙන් කියාපන් මේවායේ වතුරවල වෙනස්කම් ගැන."

"වතුර කෝකෙත් එක ම රස නෙ රජතුමනි. කියන්න තරම් වෙනසක් නෑ."

"ආන්න හරි. උඹට තේරෙනව නෙ. යකෝ. මඟුල් පොකුණ තියෙන්නෙ මහ රජතුමාගෙ පරිහරණයට. තොට තිබහ නම් තෝ ගිහින් ගෙදර ළිඳෙන් බීපිය. නිකං බෙල්ල ගහලා යන මොට්ට මෝඩ වැඩ කරන්න යන්නෙ නැතුව."

අන්දරේට හීන්දාඩිය දැම්මා.

**මහින්ද ගුණවර්ධන.**

